ව්‍යාපාර අධ්‍යයනය

12 ශ්‍රේණිය

නිපුණතාව - 3

රජය සමඟ සම්බන්ධතා පවත්වා ගනිමින් ව්‍යාපාර කරගෙන යාම

Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

පටුන

නිපුණතා මට්ටම	පාඩම	පිටු අංකය
3. 1	රජය ව්‍යාපාරවලට මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි.	3 - 4
3. 2	රජයක ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා ව්‍යාපාර දායක වන ආකාරය පෙන්වා දෙයි.	4 - 5
3. 3	රජයේ පිස්කල් ප්‍රතිපත්තිවලට අනුකූලව ව්‍යාපාර පවත්වා ගෙනයාමේ වැදගත්කම අගයයි.	6 - 8
3. 4	රජයේ මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ව්‍යාපාර පවත්වා ගෙන යාමේ වැදගත්කම අගයයි.	9 - 11
3. 5	පාරිභෝගික ආරක්‍ෂණය සඳහා රජය ගන්නා ක්‍රියාමාර්ගවලට අනුගත වෙමින් ව්‍යාපාර පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.	11 - 12
3. 6	පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනවල කාර්යභාරය විමසා බලයි.	13 -16
	පුනරීක්ෂණ	17

Copyright © www.e-thaksalawa.moe.gov.lk

3. 1 රජය ව්‍යාපාරවලට මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි.

ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කෙරෙහි රාජ්‍ය බලපෑම

- ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කෙරෙහි රාජ්‍ය බලපෑම සිදුවන ප්‍රධාන ආකාර තුනක් සඳහන් කල හැකිය.
    - x මධ්‍යම රජය
    - x පළාත් සභා
    - x පළාත් පාලන ආයතන (මහ නගර සභා / නගර සභා / ප්‍රාදේශීය සභා)
- රජය ව්‍යාපාරවලට මැදිහත් වන ආකාර

• යටිතල පහසුකම් සැපයීම

නිදසුන් :	මධ්‍යම රජය	-	විදුලි බලය සැපයීම
	පළාත් සභා	-	මාර්ග නඩත්තුව
	පළාත් පාලන ආයතන	-	අපද්‍රව්‍ය ඉවත් කිරීම

• තරඟකරුවෙකු වීම.

නිදසුන් :	මධ්‍යම රජය	-	පෞද්ගලික අංශයේ රූපවාහිනී නාලිකා සමඟ තරඟකාරී ව රාජ්‍ය අංශයේ රූපවාහිනී නාලිකා ක්‍රියාත්මක කිරීම.
	පළාත් සභා	-	ඒ ඒ පළාත් සභා යටතේ පෞද්ගලික අංශය හා තරඟකාරී ව ව්‍යාපාර පවත්වා ගෙන යාම.
	පළාත් පාලන ආයතන	-	පෞද්ගලික අංශය හා සමානව වෙළෙඳසැල් ඉදිකර කුලියට දීම.

• ගනුදෙනුකරුවෙකු වීම

නිදසුන් :	මධ්‍යම රජය	-	වී මිලදී ගැනීම, විවිධ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම ලක් සතොස හරහා භාණ්ඩ විකිණීම.
	පළාත් සභා	-	ආරක්ෂක සේවා ලබා ගැනීම හා ලබා දීම.
	පළාත් පාලන ආයතන	-	ආදාහනාගාර පවත්වා ගෙන යාම.

• ප්‍රතිපත්ති සම්පාදනය කිරීම

නිදසුන් :	මධ්‍යම රජය	-	මූල්‍ය ප්‍රතිපත්ති හා පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
	පළාත් සභා	-	ව්‍යාපාර නාම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
	පළාත් පාලන ආයතන	-	පරිසර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

- නීතිරීති පැනවීම

නිදසුන් :	මධ්‍යම රජය	-	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, ප්‍රමිති පනත
	පළාත් සභා	-	පෞද්ගලික බස් රථ සඳහා නීතිරීති පැනවීම
	පළාත් පාලන ආයතන	-	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම හා නීති රීති පැනවීම

- බදු අයකරන්නෙකු වීම

නිදසුන් :	මධ්‍යම රජය	-	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හරහා බදු අය කිරීම.
	පළාත් සභා	-	පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මගින් බදු අය කිරීම.
	පළාත් පාලන ආයතන	-	වරිපනම් බදු අය කිරීම.

රජයෙන් ව්‍යාපාර වලට ලැබෙන සහාය හා මගපෙන්වීම ව්‍යාපාර වලට වැදගත් වන ආකාරය

- x ව්‍යාපාර ලියාපදිංචියට යොමු වීම.
- x කීර්තිනාමය වර්ධනය වීම.
- x රටේ සංවර්ධනයට දායක වීම.
- x රජයේ හා මහජනයාගේ පිළිගැනීම ලැබීම.

3. 2 රජයක ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා ව්‍යාපාර දායක වන ආකාරය පෙන්වා දෙයි.

රජයක ආර්ථික අරමුණු

- x ආර්ථික වර්ධනය හා සංවර්ධනය

නිෂ්පාදන ක්‍රියාවලියේ අඛණ්ඩ වර්ධනය තුළින් ආර්ථික වර්ධනයක් සිදුවන අතර ඊට අමතරව මානව හා සමාජ දර්ශක වල දිගුකාලීන වර්ධනය සංවර්ධනය ලෙස හඳුන්වයි.

- x පූර්ණ සේවා නියුක්තිය

ශ්‍රමය සැපයීමට බලාපොරොත්තුවෙන් සිටින සියලු දෙනා යම් සේවාවක නියුක්ත වී සිටීම මෙන් ම ආර්ථිකය සතු සියලුම නිෂ්පාදන සම්පත් ඵලදායී නිෂ්පාදන කටයුත්තක යොදවා තිබීම.

- x සාධාරණ ආදායම් ව්‍යාප්තිය

රටක සමස්ත නිෂ්පාදිතය ඒ රටෙහි වෙසෙන සමස්ත ජනතාව අතර සමානව බෙදා හැරීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

x ආර්ථික ස්ථායිතාව

ආර්ථිකයේ දේශීය හා විදේශීය වශයෙන් අර්බුදයක් ඇති නොවීමට ඔරොත්තු දීමේ හැකියාව ආර්ථික ස්ථායීතාවයි.

ආර්ථික ස්ථායිතාව කොටස් දෙකකින් යුක්ත වේ.

1. අභ්‍යන්තර මිල ස්ථායීතාව
2. බාහිර මිල ස්ථායීතාව

අභ්‍යන්තර මිල ස්ථායීතාව තුළින් උද්ධමනය පාලනය, මිල මට්ටම ස්ථාවර ව පවත්වා ගැනීම, පොලී අනුපාතය පාලනය කිරීම සිදු කෙරෙන අතර,

බාහිර මිල ස්ථායීතාව තුළින් විදේශ විනිමය අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම සිදු කෙරේ.

x යහපත් අන්තර් ජාතික වෙළෙඳාම විදේශ වෙළෙඳ කටයුතු සතුටුදායක අන්දමින් පවත්වා ගෙන යාම තුළින් ගෙවුම් ශේෂ තත්ත්වය ආරක්ෂා කර ගැනීම මින් අපේක්ෂා කෙරේ.

- රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට ව්‍යාපාර වල දායකත්වය

-බදු ගෙවීම

රජයට ගෙවිය යුතු බදු පැහැර හැරීමකින් තොරව තමා උපයාගත් ලාභය හා ආදායම් මත නියමිත පරිදි බදු ගෙවීම.

-දේශීය සම්පත් භාවිතය

හැකිතාක් උපරිමයෙන් තම නිෂ්පාදන සඳහා දේශීය සම්පත් යොදා ගැනීම.

-රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම

රජය ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්ති නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හා පිළිපැදීම.

-නීති රීති පිළිපැදීම

ව්‍යාපාර සඳහා පනවා ඇති නීති රීති ඒ ආකාරයෙන් ඉටු කරමින් යහපත් ව්‍යාපාරික පරිසරයක් ගොඩනැගීමට දායකවීම.

-සේවා නියුක්තියට දායක වීම

ඵලදායි ලෙස නිෂ්පාදන කටයුතු කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් ඇතු`ළු සියලු සම්පත් කාර්යක්ෂමව භාවිතයට ගැනීම.

-පරිසරයට වන හානිය අවම කිරීම

සියලු ව්‍යාපාර පරිසර හිතකාමී ලෙස ඒවායේ ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම.

රජය හා ව්‍යාපාර අතර සබඳතාව රජය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවත්වා ගැනීම වැදගත් වේ. රජය ව්‍යාපාරවලට අවශ්‍ය පහසුකම් සැපයීම තුළින් ව්‍යාපාර දිරිමත් වේ. ව්‍යාපාර වර්ධනය තුළින් රජයේ අරමුණු ඉටු වේ.

එසේම ව්‍යාපාර වර්ධනය නිසා රජයට බදු ආදායමක් ලබා ගත හැකිය. එම ආදායම් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා හා අනෙකුත් කාර්යයන් සඳහා යොදාගත හැකි ය. මේ නිසා රජයත් ව්‍යාපාරත් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම අවශ්‍ය වේ.

අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත
පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.
Copyright © www.e-thaksalawa.moe.gov.lk

3. 3 රජයේ පිස්කල් ප්‍රතිපත්තිවලට අනුකූලව ව්‍යාපාර පවත්වා ගෙන යාමේ වැදගත්කම අගයයි.

පිස්කල් ප්‍රතිපත්තිය

x රජයේ ආදායම් හා වියදම් සම්බන්ධව රජය සිදු කරන කටයුතු පිස්කල් ප්‍රතිපත්තිය ලෙස හැඳින්වේ.

X රජයේ පිස්කල් ප්‍රතිපත්තියේ අරමුණ, සාර්ව ආර්ථික ස්ථායීතාව ආරක්ෂා කර ගැනීම වේ.

x යම් ආර්ථිකයක මුදල් වර්ෂයක් තුළ බදු හා බදු නොවන මාර්ගවලින් ලැබෙන ආදායම රාජ්‍ය ආදායම වේ.

x රජයක ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වර්ෂයක් තුළදී කරනු ලබන මුළු වියදම රාජ්‍ය වියදම වේ.

X රාජ්‍ය අයවැය ලේඛනය මගින් රජයේ පිස්කල් ප්‍රතිපත්තිය පිළිබිඹු වේ.

රාජ්‍ය ආදායම

රාජ්‍ය ආදායම

බදු ආදායම | බදු නොවන ආදායම

රජයේ බදු ආදායම

බදු ආදායම

ආදායම් බදු | එකතුකල අගය මත බදු (VAT) | නිෂ්පාදන බදු | ආනයන බදු | අනෙකුත් බදු

බද්දක් යනු,

යම් පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් අනිවාර්යෙන් ම ගෙවිය යුතු යයි රජය හෝ රජයේ බලාධිකාරී ආයතනයක් විසින් නියම කරනු ලබන ගෙවීමකි.

ආදායම් බදු : පුද්ගලයින්ගේ හා ආයතන වල ආදායම මත අය කරනු ලබන බද්දකි.

නිදසුන් :- සමාගම් බදුල උපයන විට ගෙවීම් බදු

එකතු කළ අගය මත බදු : භාණ්ඩ හා සේවා මත එකතු කළ වටිනාකමට අය කරන බදු එකතු කළ අගය මත බදු වේ.

නිදසුන් :- තොග හා සිල්ලර වෙළෙඳාම මත එකතු කළ අගය මත බදු ආනයන මත එකතු කළ අගය මත බදු

නිෂ්පාදන බදු/ දේශීය භාණ්ඩ බදු : දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ඇතැම් භාණ්ඩ මත අය කරන බදු වේ.

නිදසුන් : - සිගරට් හා දුම්කොළ නිෂ්පාදන මත බදු සුරා බදු

ආනයන මත බදු : විදේශීය රටවල් වලින් ආනයනය කරන භාණ්ඩ සඳහා රේගුවේදී අය කරන බදු වේ.

නිදසුන් :-මෝටර් රථ ආනයන මත බදු

අනෙකුත් බදු : ඉහත බදු වර්ගවලට අයත් නොවන එහෙත් අනෙකුත් පාර්ශ්වවලින් අය කරන බදු වර්ගයයි.

නිදසුන් :-වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු , සෙස් බද්ද , විදුලි සංදේශ බදු

Copyright © www.e-thaksalawa.moe.gov.lk

රජයේ බදු ආදායම පහත පරිදි ද වර්ග කළ හැකිය.

- **බදු ආදායම**
  - සෘජු බදු
    - පුද්ගල ආදායම් බදු
    - සමාගම් බදු
    - රඳවා ගැනීමේ බදු
    - ප්‍රාග්ධන ලාභ මත
  - වක්‍ර බදු
    - එකතු කළ අගය මත
    - රේගු බදු
    - නිෂ්පාදන බදු

x පුද්ගලයන්ගේ හෝ ව්‍යාපාරවල ආදායම මත හෝ වත්කම් මත අය කරනු ලබන, ගෙවන පුද්ගලයා විසින්ම දැරිය යුතු බදු සෘජු බදු වේ.

x භාණ්ඩ හා සේවා මත අය කරනු ලබන, ගෙවන ලද බද්ද වෙනත් පාර්ශ්වයකට විතැන් කළ හැකි බදු වක්‍ර බදු වේ.

රජයේ බදු නොවන ආදායම්

- බදු නොවන ආදායම්
  - **ලාභ හා ලාභාංශ නිදසුන්** ආයතනවලින් ලද ලාභ හා ලාභාංශ
  - **ගාස්තු හා අය කිරීම් නිදසුන්** මෝටර් රථ සඳහා ආදායම් ගාස්තු හා අයකිරීම්
  - **පොලී ආදායම්**
  - **වෙනත් නිදසුන්** ලොතරැයි ආදායම

රාජ්‍ය වියදම

- රාජ්‍ය වියදම
  - වර්තන වියදම්
  - ප්‍රාග්ධන වියදම්

වර්තන වියදම් : රාජ්‍ය සේවා අඛණ්ඩ ව පවත්වා ගැනීම සඳහා වසරක් තුළ නැවත නැවත සිදු කළ යුතු වියදම් ය. මේවා පුනරාවර්තන යදම් ලෙස ද හඳුන්වයි.
නිදසුන් :- වැටුප් හා වේතන , පොළී ගෙවීම්

ප්‍රාග්ධන වියදම් : රජයක් විසින් දිගුකාලීන ආයෝජන සඳහා දරන වියදම් ප්‍රාග්ධන වියදම් වේ.
නිදසුන් :- මහාමාර්ග ඉදිකිරීම් ල පාලම් ඉදිකිරීම්

x රජය විවිධ අවස්ථාවල දි විවිධ බදු වර්ග පනවන අතර විවිධ බදු වර්ග අහෝසි කිරීම ද කරනු ලැබේ. බදුවලින් ලබන ආදායම රජයේ විවිධ ව්‍යාපෘති සඳහා වැය කරයි.
නිදසුන් මාර්ග ඉදිකිරීම් ගුවන් තොටුපොල ඉදිකිරීම් හා සංවර්ධනය වරාය සංවර්ධනය

x රජයේ ආදායම් වියදම් සංයුතිය අයවැය යෝජනා ඉදිරිපත් කිරීමත් සමඟ වෙනස් විය හැකිය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

රජයේ පිස්කල් ප්‍රතිපත්තිය ව්‍යාපාරවලට බලපාන ආකාරය

- ආනයනික භාණ්ඩ සඳහා රේගු බදු අය කිරීමෙන් ආනයන සීමා වන අතර ම දේශීය නිෂ්පාදනය වර්ධනය කර ගත හැකිය. දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගත හැකි වේ.
- දේශීය නිෂ්පාදිත මත බදු අය කිරීමෙන් භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාම සිදු විය හැකිය.
- රජය, යටිතල පහසුකම් මත වියදම් දැරීම නිසා ව්‍යාපාරික කටයුතු පහසු කෙරේ.

3. 4 රජයේ මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ව්‍යාපාර පවත්වා ගෙන යාමේ වැදගත්කම අගයයි.

මූල්‍ය ප්‍රතිපත්තිය

x රටක මුදල් සැපයුම පාලනය කිරීම සඳහා රජය අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තියයි.

x රජය වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවයි.

x රජයේ මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ දේශීය ආර්ථිකය තුළ මිල ස්ථායිතාව පවත්වා ගැනීමයි. නැතහොත් උද්ධමනය පාලනය කිරීමයි. එහි දී දිගු කාලයක් පුරා මිල මට්ටම ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යාම අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කරන උපකරණ

x පොලී අනුපාතිකය

රජයේ මුදල් පාලනය සඳහා යොදා ගනු ලබන ප්‍රධාන උපකරණය පොලී අනුපාතිකය වේ. මෙය නිත්‍ය පහසුකම් අනුපාතිකය ලෙස ද මහ බැංකුව හඳුන්වයි. නිත්‍ය පහසුකම් අනුපාතිකයේ (Standing Facility Rate) ප්‍රධාන කොටස් තුනකි.

1.	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය	Standing Deposit Facility Rate (SDFR)
2.	නිත්‍ය ණය පහසුකම් අනුපාතය	Standing Lending Facility Rate (SLFR)
3.	බැංකු පොලී අනුපාතිකය	Interest Rate

නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය

වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් ඔවුන්ගේ අතිරික්ත අරමුදල් මහ බැංකුවේ ඇති රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේ දී ගෙවනු ලබන පොලී අනුපාතිකයයි.

නිත්‍ය ණය පහසුකම් අනුපාතය

වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් රජයේ සුරැකුම්පත් ඇපයට තබා මහා බැංකුවෙන් අරමුදල් ලබා ගැනීමේ දී අය කරනු ලබන පොලී අනුපාතයයි.

බැංකු පොලී අනුපාතිකය

ද්‍රවශීලතා දුෂ්කරතාවලට මුහුණ දෙන වාණිජ බැංකුවලට ශ්‍රී ලංකා මහ බැංකුව අවසාන ණය දෙන්නා ලෙස සපයනු ලබන ණය සඳහා අය කරනු ලබන පොලී අනුපාතයයි.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

සංචිත අවශ්‍යතා වෙනස් කිරීම.

වාණිජ බැංකුවල පවතින තැන්පතුවලට අදාළව මහ බැංකුවේ පවත්වා ගත යුතු තැන්පතු ප්‍රමාණය ව්‍යවස්ථාපිත සංචිතය වේ. මෙය වෙනස් කිරීම නිසා මුදල් සැපයුමේ අඩු වැඩි වීම් සිදු වේ. සංචිත අවශ්‍යතා අඩු කිරීම මුදල් සැපයුම වැඩි වීමට හේතු වේ. සංචිත අවශ්‍යතා වැඩි කිරීම මුදල් සැපයුම් අඩු වීමට හේතු වේ.

විවෘත වෙළෙඳපොළ කටයුතු (විවට වෙළෙඳපොළ කටයුතු)

මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් මිලට ගැනීම හා විකිණීම විවෘත වෙළෙඳපොළ කටයුතු වේ. මහ බැංකුව සුරැකුම්පත් මිලට ගැනීමේ දී මුදල් සැපයුම ප්‍රසාරණය වන අතර විකිණීමේ දී මුදල් සැපයුම සංකෝචනය වේ.

x වට්ටම් අනුපාත වෙනස් කිරීම

මහ බැංකුව විසින් නිකුත් කරන සුරැකුම්පත් මිල දී ගත් පාර්ශ්ව ඒවා කල් පිරීමට පෙර වාණිජ බැංකුවලට ඉදිරිපත් කර වට්ටම් කරවා ගැනීමේ දී අය කරන වට්ටම් අනුපාතිකය වෙනස් කිරීම තුළින් ආර්ථිකයේ මුදල් සැපයුම පාලනය කළ හැකි වේ.

x ණය සීමා පැනවීම

ණය සීමා පැනවීම දෙයාකාරයකට සිදු වේ.

- ප්‍රමාණාත්මක ණය සීමා පැනවීම

රටේ සමස්ත මුදල් සැපයුමට බලපෑමක් ඇති කරන බැංකු ණය ප්‍රමාණය අඩු හා වැඩි කරමින් සමස්ත ණය ප්‍රමාණය පාලනය කිරීම ප්‍රමාණාත්මක ණය පාලනය වේ.

නිදසුන් :- වාණිජ බැංකුවල ප්‍රාග්ධනය හා වත්කම් අතර අවම අනුපාත නියම කිරීම.

- ගුණාත්මක ණය සීමා පැනවීම

ආර්ථිකයක ණය ගලා යන දිශාව පාලනය කිරීම නැතහොත් ආර්ථිකයේ දිරි ගැන්විය යුතු යයි තෝරා ගත් අංශ සඳහා ණය ගලායාම දිරිමත් කිරීමත්, අධෛර්යමත් විය යුතු අංශ කෙරෙහි ණය ගලා යාම සීමා කිරීමත් අරමුණු කොට ගෙන ක්‍රියාත්මක වන ක්‍රමය ගුණාත්මක ණය පාලනයයි.

නිදසුන් :- - ණය ලබා දෙන ක්ෂේත්‍ර නිර්දේශ කිරීම.

කෘෂි කර්මාන්තය සඳහා ද?

කර්මාන්ත සඳහා ද?

ව්‍යවසායකයන් සඳහා ද? ආදී වශයෙන්

- අක්‍රීය ණය සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දැක්වීම.

x මූල්‍ය ප්‍රතිපත්ති උපකරණයක් වශයෙන් ණය පාලනය කිරීම, ශ්‍රී ලංකා මහා බැංකුවේ ඍජු ක්‍රියාමාර්ගයකි. මෙහි දී බැංකු ක්‍රමය මඟින් සැපයෙන ණය ප්‍රමාණය, ණය ආපසු ගෙවීමේ කාලය සහ ණය සඳහා ලබා ගන්නා සුරැකුම්පත් යනා දී අංශ සම්බන්ධව ප්‍රමාණාත්මක හා ගුණාත්මක පාලනයන් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ලැබී ඇත.

ණය ප්‍රමාණය පාලනය කිරීමේ දී යම් බැංකුවක, යම් දිනක හෝ කාලයක ලබා දී ඇති උපරිම ණය ප්‍රමාණය පිළිබඳව සීමා පැනවීම හෝ ණය වර්ධන අනුපාත නියම කිරීම කළ හැකි ය. තවද ආර්ථිකයේ ප්‍රමුඛ අංශවලට සැපයෙන ණය ප්‍රමාණය ධෛර්යමත් කිරීමට විවිධ නිෂ්පාදන අංශවලට දිය යුතු අවම ණය ප්‍රමාණ නියම කිරීම හෝ උද්ධමනකාරී අවධියක දී පරිභෝජන ණය වර්ධන සීමා කිරීමට පරිභෝජන ණය පිළිබඳ උපරිම සීමා නියම කිරීම කළ හැකිය.

ණය අය කිරීමේ උපරිම කාලය සහ එම ණය සඳහා බැංකු ලබා ගත යුතු සුරැකුම්වල ස්වභාවය හා වටිනාකම පිළිබඳ නියෝග පැනවීම ද කළ හැකිය. උද්ධමනකාරී අවස්ථාවක උද්ධමනය පාලනය කිරීම සඳහා පරිභෝජන ණය අධෛර්යමත් කිරීමට පරිභෝජන ණය සඳහා ඉතා කෙටි ආපසු ගෙවීමේ කාල නියම කිරීම සහ ඉහළ වටිනාකම් සහිත සුරැකුම් ගැනීමට නියම කිරීම කළ හැකිය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ඒවා ව්‍යාපාරවලට විවිධ ස්වරූපයෙන් බලපෑම් කරයි. නිදසුන් :-

x මහ බැංකුව පොලී අනුපාතිකය අඩු කිරීමත් සමඟ වාණිජ බැංකු පොලී අනුපාතිකය ද අඩු වේ. එවිට ආයෝජකයින් වාණිජ බැංකු මඟින් ලබා ගන්නා ණය ප්‍රමාණය වැඩි වීමත් සමඟ ආයෝජන ද වැඩි වේ. ඒ තුළින් නිෂ්පාදනය වැඩි වී භාණ්ඩ මිල අඩු වේ. මිල අඩු වීම නිසා ව්‍යාපාරවල පිරිවැටුම වැඩි වී ලාභ වැඩි වේ.

x මහ බැංකු පොලී අනුපාතිකය වැඩි කිරීමත් සමඟ වාණිජ බැංකු පොලී අනුපාතිකය ද වැඩි වේ. එවිට ආයෝජකයින් වාණිජ බැංකු මගින් ලබා ගන්නා ණය ප්‍රමාණය අඩු වීමත් සමඟ ආයෝජනය ද අඩු වේ. එවිට නිෂ්පාදනය අඩු වී භාණ්ඩ මිල වැඩි වේ. මිල වැඩි නිසා ව්‍යාපාරවල පිරිවැටුම අඩු වී ලාභ අඩු වේ.

3. 5 පාරිභෝගික ආරක්ෂණය සඳහා රජය ගන්නා ක්‍රියාමාර්ගවලට අනුගත වෙමින් ව්‍යාපාර පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.

පාරිභෝගික ආරක්ෂණය

පාරිභෝගිකයා ගෙවන මුදලට ප්‍රමාණවත් තෘප්තියක් ලබා දීම සහතික කිරීම පිණිස සලසා ඇති නීතිමය ආවරණය පාරිභෝගික ආරක්ෂණය වේ.

පාරිභෝගික ආරක්ෂණය මෑත කාලයේ අතීතයටත් වඩා අවශ්‍ය වීමට බලපා ඇති හේතු,

- වෙළෙඳපොළ තුළ භාණ්ඩ හා සේවා බහුල වීම.
- තරඟකාරීත්වය වැඩි වීම නිසා වෙළෙඳපොළ තුළ විෂමාචාර ඇති වීමට ඉඩ වැඩි වීම.
- නිදහස් වෙළෙඳාම සමඟ වෙළෙඳපොළ සංකීර්ණ වීම.
- ගෝලීයකරණය සමඟ ඇති විය හැකි සමාජ හා සංස්කෘතික පිරිහීම
- පරිසර දූෂණය වීම වැළැක්වීම සඳහා පාරිභෝගිකයින් දැනුවත් කිරීම අවශ්‍ය වීම.

පාරිභෝගික ආරක්ෂණයෙන් පාරිභෝගිකයාට හා ව්‍යාපාරිකයාට අත්වන වාසි

පාරිභෝගිකයාට

x ගෙවන මුදලට සරිලන වටිනාකමක් ලැබෙන භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව ලැබීම.

x වෙළෙඳ විෂමාචාරවලින් ආරක්ෂා වීම.

x ගුණාත්මක භාණ්ඩ හා සේවා පරිභෝජනය නිසා පාරිභෝගික සෞඛ්‍යය හා ආරක්ෂාව තහවුරු වීම.

x අවශ්‍ය අවසථාවල දී පාරිභෝගික ආරක්ෂණය නිසා නීතිමය රැකවරණය ලබා ගත හැකි වීම.

x පාරිභෝගිකයාට ජීවත් වීමට සුදුසු පරිසර තත්ත්වයන් උදා වීම.

ව්‍යාපාරිකයාට

x ගුණාත්මක තත්ත්වයෙන් යුක්ත භාණ්ඩ සැපයීම නිසා පාරිභෝගික විශ්වාසය දිනා ගත හැකි වීම.

X ව්‍යාපාරිකයාගේ පිරිවැටුම වැඩි වීම තුළින් ලාභය ඉහළ යාම.

X ප්‍රමිතියකට අනුව නිෂ්පාදනය කිරීම නිසා අපතය අඩු වීම.

x අයහපත් තරඟ විරෝධි ක්‍රියා නොමැති වීමෙන් යහපත් ව්‍යාපාර පරිසරයක් ඇති වීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

පාරිභෝගික අයිතිවාසිකම්

ඇමරිකා එක්සත් ජනපදයේ හිටපු ජනාධිපතිවරයෙකු වූ ජෝන් එෆ්. කෙනඩි විසින් පාරිභෝගික අයිතිවාසිකම් හතරක් ප්‍රකාශයට පත් කර ඇත.

- x ආරක්ෂාව සලසා ගැනීමේ අයිතිය
- x තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය
- x තෝරා ගැනීමට ඇති අයිතිය
- x සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතිය

මීට අමතරව පාරිභෝගික ජාත්‍යන්තරය විසින් පහත සඳහන් පාරිභෝගික අයිතිවාසිකම් ප්‍රකාශයට පත් කර ඇත.

- x මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය
- x වන්දි ලබා ගැනීමට ඇති අයිතිය
- x පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය
- x සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත් වීමට ඇති අයිතිය

ඉහත සඳහන් පාරිභෝගික අයිතිවාසිකම් අට අන්තර්ජාතික වශයෙන් පිළිගත් පාරිභෝගික අයිතිවාසිකම් වේ.

පාරිභෝගික වගකීම්

- x විචාරාත්මක දැනුවත්භාවය
- x සක්‍රීය සහභාගීත්වය
- x සමාජය ගැන සැලකිලිමත් වීම
- x පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම.
- X සහයෝගීතාව

දැනුවත්භාවයකින් යුත් පාරිභෝගිකයා ගෙවන මුදලට සරිලන වටිනාකමකින් යුත්, ප්‍රමිතියෙන් ඉහළ භාණ්ඩ තෝරා ගැනීමට පෙළඹේ. එසේ ම වෙළෙඳ විෂමාචාර හා පාරිභෝගික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව අදාළ බලධාරීන් දැනුවත් කර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරය

. තව ද, තමා ජීවත්වන පරිසරය ආරක්ෂා කර ගනිමින්, සමාජය පිළිබඳ සැලකිලිමත් වෙමින්, සහයෝගයෙන් කටයුතු කරමින්, තාර්කික පාරිභෝගිකයෙකු ලෙස වෙළෙඳපොළේ හැසිරෙයි.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

3. 6 පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනවල කාර්යභාරය විමසා බලයි.

ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන

- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
- මිණුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව
- මධ්‍යම පරිසර අධිකාරිය
- ප්‍රාදේශීය සෞඛ්‍යය වෛද්‍ය නිලධාරී කාර්යාලය
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම හා සාධාරණ වෙළෙඳපොල ක්‍රියාකාරිත්වයක් ඇති කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක ප්‍රධාන බලධාරී ආයතනයයි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු

- පාරිභෝගිකයින්ගේ ජීවිත හා දේපළවලට උපද්‍රවයක් සිදු වන භාණ්ඩ අලෙවිය හා සේවා සැපයීමට එරෙහිව ඔවුන් ආරක්ෂා කිරීම.
- අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට විරුද්ධව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීම සහතික වීම.
- හැකි සෑම විටම පාරිභෝගිකයින්ට තරඟකාරී මිලට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබා දීමට සහතික වීම.
- අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදු කරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට සහනයක් ලබා දීම.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්ය

- ව්‍යවසායන් අතර සීමාකාරී ගිවිසුම් පාලනය කිරීම හෝ ඉවත් කිරීම.
- වෙළෙඳපොළ ඇතුළත හෝ වෙළෙඳපොළේ සැලකිය යුතු කොටසක දේශීය වෙළෙඳාමේ හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදා ගැනීම නැති කිරීම.
- දේශීය හෝ ජාත්‍යාන්තර වෙළෙඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරඟකාරීත්වය පිළිබඳ අවහිරතා නැති කිරීම.
- තරඟ විරෝධී චර්යා හා ආධිපත්‍ය තත්ත්ව අනිසි ලෙස යොදා ගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂා කිරීම.
- භාණ්ඩ හා සේවා සපයන තැනැත්තන් අතර ඵලදායී තරඟකාරීත්වය පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම.
- භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබා ගැනීමට හැකි වීම සහ ඒවායෙහි තත්ත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් හා සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය

- x අධිකාරිය විසින් නියම කර ඇති ප්‍රමිතියට අනුව නිෂ්පාදනය, සැපයීම, ගබඩා කිරීම, ප්‍රවාහනය හා විකිණීම සිදු කිරීම නිසා නාස්තිය අවම වී ලාභය වර්ධනය වීම.
- x පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යොමු වීම නිසා පාරිභෝගික විශ්වාසය දිනා ගැනීමට හැකි වීම.
- x වෙළෙඳ විෂමාචාරවලින් වැළකී කටයුතු කිරීමෙන් ආයතනයේ ප්‍රතිරූපය වර්ධනය වීම.
- x ව්‍යාපාරිකයාට මුහුණ දීමට සිදු වන නෛතික තත්ත්වයන් අවම වීම.
- x ව්‍යාපාර අතර ඇති වන අනවශ්‍ය තරඟකාරීත්වය අවම වීම.
- x ඒකාධිකාරී තත්ත්වයන් ඇති නොවීම නිසා සාධාරණව තරඟ කළ හැකිවීම.

පාරිභෝගික කටයුතු පිලිබඳ සභාව

පාරිභෝගිකයන් විසින් අධිකාරියට සිදු කරනු ලබන පැමිණිලි සහ ව්‍යාපාරිකයන් විසින් සිදු කරන විෂමාචාර විමර්ශනය කිරීම සඳහා පිහිටුවා ඇති ආයතනනයි. මෙය සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විතය.

2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරි පනත ක්‍රියාත්මක කිරීමත් සමග සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත, මිල පාලන පනත සහ පරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත අහෝසි කෙරිණි.

පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරී පනතේ සදහන් වන වෙළෙඳුන් විසින් සිදු කිරීමට ඉඩ ඇති වැරදි

- භාණ්ඩයේ සදහන් උපරිම මිලට වඩා වැඩි මිලකට භාණ්ඩ විකිණීම.
- ලේබල් හෝ විස්තර වෙනස් කිරීම.
- අවශ්‍යතාවට වඩා වැඩියෙන් භාණ්ඩ තොග රැස් කර තබා ගැනීම.
- භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප කිරීම.
- භාණ්ඩයේ මිල ලේබල් කිරීම පැහැර හැරීම.

පාරිභෝගික ජාත්‍යන්තරය

ලෝකයේ රටවල් 115 ක පමණ පාරිභෝගික සංගම් 228 කින් යුක්ත අන්තර්ජාතික සංවිධානයකි. ලොව වෙසෙන සියලු පාරිභෝගිකයන්ගේ අයිතීන් රැක ගැනීම පිණිස මෙය ක්‍රියාත්මක වෙයි. 1960 දී අන්තර්ජාතික පාරිභෝගික සමිති සම්මේලනය නමින් ආරම්භ කල අතර 1995 සිට "පාරිභෝගික ජාත්‍යන්තරය" ලෙස හඳුන්වයි. මෙහි ප්‍රධාන කාර්යාලය එංගලන්තයේ ලන්ඩන්හි පිහිටා ඇත.

ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය

නිෂ්පාදන කටයුතු උසස් මට්ටමක පවත්වාගෙන යාමත්, ඒවා දියුණු කිරීමත්, පිරිවැය අවම කිරීමත් සඳහා ජාතික අවශ්‍යතාවලට ගැලපෙන අයුරින් ප්‍රමිති පද්ධතියක් සකසා පවත්වාගෙන යාමේ අරමුණු පෙරදැරි කරගෙන 1984 අංක 06 දරණ ශ්‍රී ලංකා ප්‍රමිත ආයතන පනත යටතේ පිහිටුවා ඇත.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අරමුණු

- x නිෂ්පාදන ක්‍රියාවලිය හා සැකසීම පිළිබඳව ජාතික හා අන්තර්ජාතික පදනම මත ප්‍රමිති පිළියෙල කිරීම.
- x කාර්මික හා වාණිජ ක්ෂේත්‍රවල ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලනය ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා රසායනාගාර හා පුස්තකාල සේවා පිහිටුවා පවත්වාගෙන යාම.
- x දේශීය නිෂ්පාදිත මෙන් ම ආනයනය කරන ලද භාණ්ඩ ප්‍රමිතිවලට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම.
- x ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලන කටයුතු සඳහා පර්යේෂණ පහසුකම් සැපයීම.
- x ප්‍රමිති සහතික සලකුණු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- x ජාත්‍යන්තර ප්‍රමිති ආයතන හා ඒ සමාන කටයුතුවල යෙදෙන සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- x අධ්‍යාපනය, උපදේශනය හා වෙනත් මාර්ගවලින් ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලන කටයුතු දිරිගැන්වීම.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්ය

- x ප්‍රමිති පිළියෙල කිරීම.
- x ප්‍රමිති ක්‍රියාත්මක කිරීම.
  - ස්වේච්ඡාවෙන්
  - SLS සහතික ලාංඡන ක්‍රමය මඟින්
  - පූර්ව අපනයන පරීක්ෂාව මඟින්
  - ආනයන පරීක්ෂාව මඟින්
  - අපනයන පිළිබඳ පිළියෙල කළ මුහුදු ආහාර පරීක්ෂාව මඟින්
- x ISO ප්‍රමිති ක්‍රියාත්මක කිරීම.
- x ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය පිළිබඳ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම.
- x ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලන ප්‍රවර්ධන කටයුතු
- x උපකරණ ක්‍රමාංකන සේවා
- x පාරිභෝගික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම.
- x පුස්තකාල සේවාව, දේශීය විදේශීය ප්‍රමිති අලෙවිය සහ තොරතුරු සේවා
- x තත්ත්ව පද්ධති පිළිබඳ අන්තර්ජාතික ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය

- x SLS ලකුණ සහිත නිෂ්පාදිත අලෙවි කිරීම තුළින් තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකිවීම.
- x SLS ලකුණ නොමැති නිෂ්පාදන ආයතන අභිබවා නියම වශයෙන් වාසිදායක තත්ත්වයක් ලැබිය හැකිවීම.
- x පාරිභෝගික පැමිණිලි අවම කර ගත හැකි වීම.
- x රාජ්‍ය අංශය SLS සලකුණ සහිත භාණ්ඩ මිල දී ගැනීමට ප්‍රමුඛත්වයක් දෙන බැවින් වෙළෙඳපොළ කොටස පුළුල් කර ගත හැකි වීම.
- x විදේශ සහතික කිරීමේ සලකුණු (ISO)ලබාගැනීම තුළින් විදේශ වෙළෙඳපොළේදී සාර්ථක වීමට ඉඩලැබීම.
- x ප්‍රමිතීන් තුළ පාරිභෝගික අවශ්‍යතා හා නෛතික අවශ්‍යතා ඇතුළත් වන බැවින් නිෂ්පාදිත පිළිබඳ පිළිගත හැකි මට්ටම ඉහළ යාම.
- x නාස්තිය අවම වී ඵලදායීතාව වර්ධනය වීම.
- x ආයතනයේ ප්‍රතිරූපය වර්ධනය වී සේවක චිත්ත ධෛර්ය වර්ධනය වීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය ප්‍රමිත ක්‍රියාත්මක කරන ආකාර

1. ස්වේච්ඡාවෙන්
2. ප්‍රමිත සහතික ලාංඡන ක්‍රමය මගින්
3. පූර්ව අපනයන පරීක්ෂාව මගින්
4. පූර්ව ආනයන පරීක්ෂාව මගින්
5. විදුලි උපකරණ ශක්ති කාර්යක්ෂමතා ලේබල්කරණය මගින්

ප්‍රමිතියක් යනු,

විද්‍යාවෙත්, තාක්ෂණයේත්, පලපුරුද්දෙත් ඒකාබද්ධ ප්‍රතිඵල පදනම් කරගෙන අදාළ සියලු අංශ වල පොදු අනුමැතිය හා ඒකමතිකභාවයෙන් පිළියෙළ කොට අන්තර්ජාතික, කලාපීය හෝ ජාතික මට්ටමෙන් පිළිගත්, ජාතික මට්ටමෙන් අනුමත කර මහජනයා වෙත නිකුත් කරන තාක්ෂණික පිළිවිතරයකි.

<u>සහතික ලාංඡන</u>

1. **SLS (SRI LANKA STANDARDS)**
ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනයේ ප්‍රමිතීන්ට අනුව භාණ්ඩ නිෂ්පාදනය කොට ඇති බවට සහතික වෙමින් SLS සහතිකය ලබාදෙයි.

SLS ලබා ගැනීමේ වාසි

නිෂ්පාදකයාට	පාරිභෝගිකයාට
• විධිමත් ප්‍රමිතකරණයක් සහ තත්ව පාලනයක් පවත්වා ගත හැකිවීම. • නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩි වීම. • නාස්තිය අවම වීම. • ප්‍රචාරණ කටයුතු වලදී වාසියක් වීම. • රජයේ ආයතන මිලදී ගැනුම් වලදී විශේෂත්වයක් දැක්වීම. • පාරිභෝගික විශ්වාසය වැඩි වීම. • කීර්තිනාමය ඉහළ යාම.	• භාණ්ඩ විශ්වාසදායක ලෙස තෝරා ගත හැකි වීම. • ගෙවන මුදලට උපරිම තෘප්තියක් ලැබෙන බවට සහතිකයක් වීම. • නිෂ්පාදන පිරිවැය අඩු වීම නිසා භාණ්ඩ වල මිල ගණන් අඩු වීම. • ගැටලුකාරී තත්වයකදී නීතිමය ආවරණ ලබා ගත හැකි වීම. • ජාතික ප්‍රමිතියට අනුව නිපදවා ඇති බවට තෙවන පාර්ශ්ව සහතිකයක් ලැබීම.

2. **ISO 2008 -** තත්ව කළමනාකරණ පද්ධති සහතිකකරණය
3. **ISO 14001 -** පාරිසරික කළමනාකරණ පද්ධති සහතිකකරණය
4. **ISO 22000 -** ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති සහතිකකරණය
5. **HACCP -** උපද්‍රව විශ්ලේෂණ හා අවධි පාලන අවස්ථා සහතිකකරණය
6. **OHAS 18001 -** වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතා කළමනාකරණ පද්ධති සහතිකකරණය
7. **SA8000 -** සමාජ වගවීම් සහතිකකරණය
8. **GMP -** යහපත් නිෂ්පාදන පිළිවෙත් සහතිකකරණය

Copyright © www.e-thaksalawa.moe.gov.lk